---

අට්ටාලෙයිචේනායි ප්‍රදේශිය සභාව

අම්පාර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන .

---

1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 25 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 මැයි 26 දින ඉදිරිපත් කරන ලදි . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 ජනවාරි 29 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 . මතය .

---

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ අට්ටාලෙයිචේනායි ප්‍රාදේශිය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර පිළියෙල, 2010 දෙසැම්බර් 31 දිනට අට්ටාලෙයිචේනායි ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ පිළිබඳව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 . මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම .

---

1.3.1 . ගිණුම්කරණ ප්‍රතිපත්ති .

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර නොතිබුණි .

( ආ ) ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදනය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

1.3.2 ගණකාධිකරණ අඩුපාඩු .

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 ( 2 ) වගන්තිය ප්‍රකාරව ගිණුම් වල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

( ආ ) සභාවේ ඉඩම් සහ ගොඩනැගිලි අගය කර ගිණුම් ගතකර නොතිබුණි .

( ඇ ) ආපසු ගෙවිය යුතු තැන්පතු රු . 589,312 ක් පිළිබඳ තොරතුරු නොතිබුණි .

( ඈ ) විදුලි උපකරණ තොගයේ භෞතිකව හරිවැරදි බැලූ වටිනාකම දක්වනු වෙනුවට පොත් අගය මත වටිනාකම වූ රු . 151,891 ක් ලෙස දක්වා තිබුණි .

( ඉ ) ස්ථාවර තැන්පතු පොලිය ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි .

(ඊ) මූල්‍ය ප්‍රකාශයන් රජයේ ප්‍රාග්ධන ප්‍රදාන රු . 14,153,216 කින් වැඩියෙන් දක්වා තිබුණි .

(උ) 2000 සිට 2009 කාල පරිච්ඡේදය සඳහා වූ රු . 309,236 ක් සභාවේ වෙනත් තැන්පතු නිරවුල් කර නොතිබුණි .

1.3.3 . අනුකූල නොවීම් .

පහත සඳහන් නීති , රීති . රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය .

| නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව . | | අනුකූල නොවීම් . |
|---|---|---|
| ( අ ) ප්‍රාදේශීය සභා ( මූල්‍ය සහ පරිපාලන ) රීති - 1988 . | | |
| රීති අංක 180 | - | මුදල් සහ ගබඩා පරිහරණය කරන නිලධාරීන් විසින් ආරක්ෂිත ඇප තැන්පතු තබා නොතිබුණි . |
| රීති අංක 217 | - | සභාව විසින් පිඑස් 46 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි . |
| රීති අංක 218 | - | සුදුසු නිලධාරියෙකු විසින් ඉඩම් සහ |

ගොඩනැගිලි සමීක්ෂණය කර නොතිබුණි .

2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය .

2.1 මූල්‍ය ප්‍රතිඵල .

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු . 142,489 ක් වූ අතර එයට එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු . 2,349,154 ක් විය .

2 . 2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| | ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත . | තථ්‍ය . | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිග ආදායම |
|---|---|---|---|---|
| | | රු . 000 | රු . 000 | රු. 000 |
| i | වරිපනම් සහ බදු | 10 | 20 | - |
| ii | කල්බදු | 2,394 | 1,167 | 156 |
| iii | බලපත්‍ර ගාස්තු | 585 | 295 | - |
| iv . | වෙනත් ආදයම් | 288,300 | 835 | - |

2.2.2 උසාවි දඩ

අක්කරපත්තු මහේස්ත්‍රාත් උසාවි විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර තිබූ රු. 835,150 ක් වූ උසාවි දඩ අයකර ගෙන පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි .

2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු. 1,036,805 ක් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැයගත වියදම, තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ .

| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 000 | රු. 000 | රු. 000 |
| පුද්ගල පඩිනඩි | 8,709 | 8,621 | 88 |
| වෙනත් | 4,477 | 2,798 | 1,679 |
| උප එකතුව | 13,186 | 11,419 | 1,767 |
| ප්‍රාග්ධන වියදම් | 28,013 | 1,276 | 26,236 |
| මුළු එකතුව | 41,199 | 12,695 | 28,003 |

2.4 . අයකරගත යුතු සේවක ණය .

2010 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු සේවක ණය ශේෂ එකතුව රු . 3,268,509 ක් වූ අතර එයින් අවුරුදු 01 ක් ඉක්ම වූ ශේෂ එකතුව රු . 10,120 ක් විය .

2.5 මානව සම්පත් කළමනාකරණය .

අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පහත දැක්වේ .

| තනතුරු වර්ගය . | අනුමත . | තථ්‍ය . |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | - |
| ද්විතියික ශ්‍රේණිය | 09 | 12 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 14 | 14 |
| වෙනත් | - | 08 |
| | 24 | 34 |

2.6 . අභ්‍යන්තර විගණනය .

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි .

3 . පද්ධති හා පාලන .

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

( අ ) ගිණුම්කරණය .

( ආ ) ස්ථාවර වත්කම් පාලනය .

( ඇ ) ආදායම් පරිපාලනය .